ද මැසිනොඩ් විදුහල, කඳාන

De Mazenod College, Kandana

# සිංහල හා සාහිත්‍යය

පළමු වාර පරීක්ෂණය - 2024 | 9 ශ්‍රේණිය | කාලය පැය 02

➢ ප්‍රශ්න හොඳින් කියවා නිවැරදි පිළිතුර තෝරන්න.

• ඉරි ඇති පදයේ අර්ථය ඇති පිළිතු තෝරන්න.

1) ජන කොට්ඨාසයක ලේඛන ගත නොවූ ඉතිහාසය ජනශ්‍රැතියක ඇතුළත් විය හැකියි
   1. නොලිඛිත
   2. ලිඛිත
   3. අලිඛිත
   4. ද්විලිඛිත

2) ඔවුන්ට අයිති මුළු ධන සම්පත්තියෙහි ම පාලනය ඔවුන් වෙත පැවරිණි
   1. ලෝකය
   2. සත්කෝෂය
   3. සතුට
   4. වස්තුව

3) භාෂා ශාක්‍යතාවන් වර්ධනය කර ගැනීමට නම් මුලින්ම කළ යුත්තේ හොඳින් සවන් දීමයි .
   1. ස්මරණය
   2. පෙළඹවීම
   3. හැකියා
   4. ශ්‍රවණය

4) ලෝකයට දායාද කළ පුත්‍රරත්නයක ජන්ම දිනය අදට යෙදී තිබේ
   1. මියගිය
   2. උපන්
   3. කළුරිය කළ
   4. භාග්‍යවරය ලත්

5)මැණිකා [illegible]
   1. අවශ්‍යතා ඉටුවී ඇති බව
   2. වාසියක් සිදු වී ඇති බව
   3. අස්වැන්න මෝරා ඇති බව
   4. විඩාවට පත් වී ඇති බව

6) ස්ටීවන් හෝකින් පිළිබඳ නිවැරදි පිළිතුර වන්නේ
   1. කළු කුහරවලින් පිටවන විකරණය විකිරණය ඉදිරිපත් කර ඇත
   2. ජයවර්ධනපුර විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකි
   3. රාම්ගෝපාල් උදේශංකර සමීපතම මිතුරන් විය
   4. සෞන්දර්ය අධ්‍යයන ආයතනය මගින් පිරිනමන ලද ආචාර්ය උපාධිය ලබාගෙන ඇත

7) කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම
   1. ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වගේ
   2. පණිත රිලවුන්ට ඉණිමං බැන්දා වගේ
   3. ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ
   4. ගහට ඉණි කැපුවා වගේ

8) ජන්මයෙන් ලත් දුර්ගුණ ඉවත ලිය නොහැකි වීම,
   1. උණුපුරුකේ දැම්මත් බලු වලිගේ ඇද නැරේ
   2. කසල ගොඩේ තිබුණත් මැණික මැණිකමලු
   3. පිරුණු කළේ දිය නොසැලේ
   4. අවි ගත්තෝ අවියෙන්ම නසිති

9) එකිනෙකාට සමාන අර්ථ ඇති පද එකතු වී සෑදෙන යුගල පද දැක්වෙන පිළිතුර වන්නේ
   1. නඩු හබ, දුක් දොම්නස්, අරුම පුදුම, මිල මුදල්
   2. දුක් දොම්නස්, ගේ දොර, කවා පොවා, කර කියා
   3. අරුම පුදුම, එහෙ මෙහෙ, මුදල් හදල්, අබල දුබල,
   4. අබල් බබල්, මිල මුදල්, ගේ දොර, ගසා බසා

10) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පිළිතුර වන්නේ
1. ප්‍රසිද්ධ - පුවතර, පසිඳු, පතළ, ප්‍රකට
2. ගස - වෘක්ෂය, තුරු, රුක, පාදප
3. රන් - කනක, කාංචන, කසුන්, රුවනාර
4. සඳ - තාරපති, සිසි, සොමි, තරිඳු

11) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් පදය නොවන්නේ
1. චල - නිශ්චල, පිපි
2. ඵල - නිෂ්ඵල, පිපි, විකසිත
3. සරු - නිසරු, දොස්, නිදොස්,
4. ගඳ - දුගඳ, ගුණ, දුර් ගුණ

12) ඕෂ්ඨජ අක්ෂර පමණක් මුලට යෙදී ඇති වචන සහිත පිළිතුරු තෝරන්න
1. පරවියා, එළදාව, බවලතා, භාණ්ඩය, මණ්ඩලය
2. පරවියා , නදිය, ටකරම, බවලතා, බණ්ඩක්කා,
3. තරුව, පරවියා, මණ්ඩලය, නදිය, ටකරම
4. නදිය, දක්ෂ, තරුව, පරවියා, බණ්ඩක්කා

13) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි වන සේ ඇති පද පේළිය තෝරන්න
1. ව්‍යායාමය, කළ්‍යාණ, ව්‍යාංගාර්ථ, ප්‍රසාංගික
2. කතෘ, ව්‍යුහය, පිළිතුරු, පවුරාණික
3. සූයර්යා සමාජයීය, අධ්‍යාත්මික, කල්‍යාණ,
4. සංයෝජනය, ස්වාධීන, පරිත්‍යාග, ව්‍යාංගාර්ථ

14)
1. සමෘද්ධිය, වෛර් න, චිත්‍රණය, මිත්‍රයා
2. බෞද්ධ, සංයුතිය, අධීක්ෂණය ස්ථාවර
3. ස්ථාවර, ස්වභාවික, මලල ක්‍රීඩා, පිළිතුරු,
4. ප්‍රකාශන, ප්‍රශස්ත, සංවිධානය, සංයුතිය

15) උපමාවක් ඇතුළත් පිළිතුර වන්නේ
1. වම්මා කඳුළැලි ඉස ඉස ඇවිදින් දැයි අම්මා
2. වටදහසක් ගව් හිමයේ ගියදෝ අපෙ අම්මා
3. අඳුන් තෙලින් නිති සරසා ඇතිකළදැයි අම්මා
4. තුරු පිරිවර පුන් සඳ මෙන් වන මැද උන් නෙමිමා

16) පහත කවියේ සිව්වන පදය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ
කරුණා මහිම කොයි තරමද කීවොත් ඔබේ
මැවුනා මහ ගංගාවල් ලෙයින් ඉබේ
ඉණුනා බසින දියරක් තැවරුණොත් මොබේ
...............................................
1. වඩිම් සැලකිලි කරති නිතරම
2. වැන්දා මෙන්න මුඳුණත් නගමින් දැම්මේ
3. මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ
4. බන්දා විජය දද අකනිට පැ නිමමේ

17) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ
"මං ඉදහිට වෙල පැත්තට යනව "
1, මම බොහෝ කලකට පසු කුඹුර දෙසට යමි
2. මම කලාතුරකින් කුඹුර දෙසට යමි
3. මම මාස කිහිපයකට පසුව කුඹුරට යමි
4. මම ඉඳහිටත් කුඹුරට නොයමි

18) මූර්ධජ අක්ෂරයක් ඇතුළත් නොවන වචනය වන්නේ
1. පීය්‍ය
2. සංඛ්‍යාව
3. පණිවිඩය
4. ආරුඪ

19) නිවැරදි වාක්‍ය තෝරන්න
1. ගොවීන් ගවයන් දක්කති
2. ගොවීහු ගවයන් දක්කති
3. ධීවරයෝ මාළුන් අල්ලයි
4. ධීවරයන් මාළුන් අල්ලති

20)

1. කුරුල්ලෝ අහසෙහි පියාසර කරති ම
2. කුරුල්ලන් අහසෙහි පියාසර කරති
3. කුරුලෝ අහසෙහි පියාසර කරයි
4. කුරුල්ලන් අහසෙහි පියාසර කරයි.

Learning Resource Cen
R
De Mazenod Colle
Kandana

2024-06.
9 ශ්‍රේණිය
සිංහල.

## II කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

1) පහතින් එක් මාතෘකාවක් තෝරාගෙන වචන 200ක් පමණ රචනයක් ලියන්න
1. මාර් ග අනතුරු වලකමු
2. අධ්‍යාපනය සැමගේ අයිතියකි
3. ජනකථාවේ අගය
4. ස්වභාවික සම්පත් සුරකිමු

ලකුණු 20

2) නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතා කරමින් පිළිතුරු සපයන්න
1. සිය ආචාර්....... උපා.........ය සඳහා ඔහු විසින් තෝරා ගනු ලැබුවේ සා.......රණ සාපේක්.......තා වාදය හා වී.......ව න්‍යාය යන්න ක්ෂේත්‍රයයි
2. ගුවන් විදුලි සංස්........ව විවෘත කර.......... අවස්ථාවට මගුල් බෙර වාදනයට අවස්.........ව ලැබුණි
3.
4. මේ ශ්‍රේ...... ........ මිනිසා අප අතරින් වෙන් වී ගියේ පෙබරවාරි 20 වන දායි

ලකුණු 10

3) පහත ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

ගඟට කපන ඉණි ගහ දිය රැගෙන යති
සැපට වැඩුණු කය පොළොවට දිරා යති
අපට නොවේ බඹුටත් මරු ළඟා වෙති
පිනට දුන්නු දේ පමණක් ඉතුරු වෙති

මලේ සුවඳ නැතිවෙයි පෙති හැලුනාම
ගතේ <u>රුසිරු</u> නැතිවෙයි රැළි වැටුණාම
ගඟේ මහිම නැතිවේ දිය සිඳුණාම
දුන් දේ සුවඳ පවතී ලොව හැමදාම

කෑමෙන් කෑම සපයාගෙන කෑම
බීමෙන් හොඳ බීම මවුගේ කිරි බීම
දීමෙන් හොඳ දීම දුගියාට දන්දීම
යෑමෙන් හොඳ යෑම **<u>නිර්වාණෙට</u>** යාම

කන බොන කෑම තනියම වලදන්න එපා
අසරණ කෙනෙක් ආ විට එලවන්න එපා
අනුවණකමින් පව් සිදු කරගන්න එපා
නොමැරෙන කෙනෙකු ලෙස ජීවත් වෙන්න එපා

1. ඉරි ඇඳි පද දෙකේ අර්ථය ලිහිල් බසින් ලියන්න.
2. නිපාත පද දෙකක් උපුටා ලියන්න
3. පහත විරුද්ධාර්ථ උපසර්ග වෙන් කරන්න
   1) අසරණ
   2) අනුවණ
   3) නොමැරෙන
4. ඉහත ගීතයේ දක්නට ලැබෙන කාව්‍යාලංකාරයක නම ලියන්න
5. ඉහත ගීතයට ඔබ නමක් යෝජනා කරන්න

ලකුණු10

262

4) කොටි පිළිතුරු සපයන්න.

1. වර්තමාන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර කීයද ?
2. සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර කීයද
3. ව්‍යඤ්ජන අක්ෂර කීයද
4. වර්ගාක්ෂර කීයද ?
5. කණ්ඨජ අක්ෂර යනු කුමක්ද ?
6. පෙළ පොතේ සඳහන් 'මල් මල් වාරම්' ගීතයේ රචකයක් කවුද
7. ලප සේ සඳ විලසේ පාඩමේ කවි උපුටා ගත් මුල් කෘතියේ නම කුමක්ද ?
8. ශ්‍රී පාදය වැන්ද වූ හැටි පාඩම උපුටා ගත් මුල් කෘතියේ නම කුමක්ද ?
9. දේශීය නතර්නයේ රන් සලකුණු ලෙස හැඳින්වූ පුද්ගලයා කවුද
10. ජනශ්‍රැතිය යන්න නිවර්වනය කරන්න

ලකුණු 10

5) ෙම ප්‍රකාශ කා විසින් කාහට කියන ලද්දක්ද

1. ''මම එය මගේ පුතුන්ට කියා බලමි ''
2. ''අප සේ පිය රජුනි දනාට නොදෙන්නේ අපේ අම්මා''
3. ''මම බෙරේ කරේ දාගෙන සැතැප්ම ගාණක් පයින් ගියා කෙනෙක්''
4. '' එතුමා ගැන ඔබට කියන්නට අවස්ථාව උදාකර දීම පිළිබඳව ප්‍රණාමය පිරිනමන්න කැමති ''
5. ''සිත්සේ වැඳ පුදා ගනු මැනව ''